# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1763/11 - 2012 ජුනි මස 19 වැනි අඟහරුවාදා - 2012.06.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වැඩබලන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා වන මම, මෙහි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩය සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි. මෙම නියමය 2012 ජුනි මස 20 වැනි දින සිට ආරම්භ වන මාසයක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2012 මැයි මස 11 වැනි දිනැති අංක 1757/23 දරන අති විශේෂ ගැසට් පත්‍රය, මගින් සීනි (සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 17.01) සඳහා ප්‍රකාශිත අදාල නියමයන් 2012 ජුනි මස 20 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

සරත් අමුණුගම,
වැඩබලන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2012 ජුනි මස 19 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

| *I වැනි තීරය* | | | | *II වැනි තීරය* |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං.ව. ශීර්ෂය | සං.ව. සංකේතය | විස්තරය | |
| 01. | 17.01 | | ඝන තත්ත්වයේ ඇති උක් හෝ බීට් සීනි සහ රසායනිකව පවිත්‍ර සුක්‍රෝස් | |
| | | | එකතු කරන ලද රස කාරක හෝ වර්ණක අඩංගු නොවූ ශුද්ධ නොකළ සීනි | |
| | | 1701.11 | උක් සීනි | කි.ග්‍රෑමයට රු.20 |
| | | 1701.12 | බීට් සීනි | කි.ග්‍රෑමයට රු.20 |

1A - G 16241 — 985 (2012/06)

**උපලේඛනය** (සම්බන්ධිතයි)

| *I වැනි තීරය* | | | | *II වැනි තීරය* |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං.ව. ශීර්ෂය | සං.ව. සංකේතය | විස්තරය | |
| | | | අනෙකුත් | |
| | | 1701.91 | එකතු කරන ලද රස කාරක හෝ වර්ණක අඩංගු | |
| | | 1701.91.10 | සීනි | කි.ග්‍රෑමයට රු.20 |
| | | 1701.91.90 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු.20 |
| | | 1701.99 | අනෙකුත් | |
| | | 1701.99.10 | සුදු ස්ඵටිකකෘත උක් සීනි | කි.ග්‍රෑමයට රු.20 |
| | | 1701.99.20 | සුදු ස්ඵටිකකෘත බීට් සීනි | කි.ග්‍රෑමයට රු.20 |
| | | 1701.99.30 | අනෙකුත් සීනි | කි.ග්‍රෑමයට රු.20 |
| | | 1701.99.90 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු.20 |

07-294

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.